සමාජ සවිබලගැන්වීම් හා සුබසාධන අමාත්‍යාංශය
சமூக வலுவூட்டல் மற்றும் நலனோம்புகை அமைச்சு
MINISTRY OF SOCIAL EMPOWERMENT AND WELFARE

දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව
வாழ்வின்எழுச்சி அபிவிருத்தி திணைக்களம்
**Department of Divineguma Development**

1වන අධියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල.
1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல
1st 4th floor, **Sethsiripaya ,Battaramulla**

මගේ අංකය / எனது இல / My No: DDD/HO/08/PM/05/Prog.Rep

ඔබේ අංකය / உமது இல / Your No: ..............................

දිනය / திகதி / Date: 2016.05.12

සියලුම දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂකවරුන් වෙත,

**<u>2016 වසරේ ජීවනෝපාය ව්‍යාපෘති මෙහෙයවීම, පසු විපරම් කිරීම හා ඇගයීම</u>**

1. 2016 - 2018 කාලයට අදාලරජයේ මධ්‍ය කාලීන අයවැය රාමුවේ ඇතුළත් ඉලක්ක ළඟා කර ගනිමින් ආර්ථික වර්ධනය කඩිනම් කිරීම සඳහා මුදල් අමාත්‍යාංශය විසින් ශූන්‍යපාදඅයවැයකරණය (Zero Based Budgeting) හඳුන්වා දී ඇත. ඒ තුළින්, රාජ්‍ය ආයතන ක්‍රියාකාරීත්වයට අදාලවගවීම ස්ථාපිත කිරීම, විනිවිදභාවය තහවුරු කිරීම, මූල්‍ය විනය ඇති කිරීම හා සීමිතපොදු සම්පත් ඵලදායීව යොදාගැනීම අපේක්ෂා කරනු ලැබේ.

2. ඒ අනුව, සැලසුම්කරණය, අයවැයකරණය හා සමාලෝචන ක්‍රියාදාමය එකට සම්බන්ධ කිරීමට ද අපේක්ෂා කරන අතර, එහි එක්ප්‍රධානහාවැදගත්අංගයක්ලෙසින්, රාජ්‍ය අයවැය දෙපාර්තමේන්තුව මඟින් කාලීනව එනම්, සති දෙකකට වරක්, මාසිකව, තෛමාසිකවආදී වශයෙන්, ක්‍රියාත්මක කරනු ලබනව්‍යාපෘතිවල මූල්‍ය හා භෞතික ප්‍රගතිය අඛණ්ඩව සමාලෝචනය කරනු ලැබේ. ඒ අනුව,අප දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක කරනු ලබන සියලු ව්‍යාපෘතිවලට අදාලවඉලක්කගතනිමවුම්(Out Put), හා ප්‍රතිඵල (Out Come)කාලීනව අප අමාත්‍යාංශය මඟින් මහා භාණ්ඩාගාරයට වාර්තා කළ යුතුව ඇත.

3. මේසඳහා, රාජ්‍ය අයවැය දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් ආකෘතිපත් හඳුන්වා දී ඇති අතර, එම පත්‍රිකා කාලීනව, විධිමත්ව සම්පූර්ණ කොට, එකිනෙක ඉදිරියෙන් දක්වා ඇති දිනවලදී, අප අමාත්‍යාංශය මඟින් රාජ්‍ය අයවැය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළයුතුව ඇත.

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් / மேலதிக பணிப்பாளர்தலைமையதிபதி / Additional Director General | අධ්‍යක්ෂ (පාලන) / பணிப்பாளர் (நிர்வாகம்) / Director (Administration) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|
| Tel- | 011-2873802/2872202 | 011-2871672 | 011-2873799 | 011-2887280 |
| Fax - | 011-2889002 | 011-2887280 | 011-2873996 | **011- 2887722(Hotline)** |
| E-mail- | dg@divineguma.gov.lk | adg@divineguma.gov.lk | diradmin@divineguma.gov.lk | |

## ප්‍රගති සමාලෝචන ආකෘති පත්‍ර

| ආකෘති පත්‍ර අංකය | විස්තරය | ඉදිරිපත් කළයුතු දිනය/ කාලය | වගකීම |
|---|---|---|---|
| **2 (A)** | සංවර්ධන ව්‍යාපෘතිවලට අදාල ප්‍රාග්ධන වියදම්වල මූල්‍ය ඉලක්ක හා කාර්යසාධනය | ❖ සති දෙකකට වරක් *(පළමු සති 2 වාර්තාව එම මාසයේම 23 දිනට පෙර) හා * (අවසන් සති 2 වාර්තාවර්ළඟ මස 04 දිනට පෙර) | අධ්‍යක්ෂ (සැලසුම් හා මෙහෙයුම්) |
| **2 (B)** | සංවර්ධන ව්‍යාපෘතිවල භෞතික ඉලක්ක හා කාර්යසාධනය | මසකට වරක් * (අදාල මාසයට පසුව එළඹෙන මස 04 දිනට පෙර) | -එම- |
| **3** | ප්‍රාග්ධන වියදම්වලට අදාල වත්කම් අත්පත් කරගැනීම හා වැඩිදියුණු කිරීම සහ ධාරිතා සංවර්ධනයයන කටයුතුවල කාර්යසාධනය | මසකට වරක් * (අදාල මාසයට පසුව එළඹෙන මස 04 දිනට පෙර) | ප්‍රධාන ගණකාධිකාරී හා අධ්‍යක්ෂ (පුහුණු හා පර්යේෂණ) |
| **4** | පුනරාවර්තන වියදම්වල කාර්යසාධනය | මසකට වරක් * (අදාල මාසයට පසුව එළඹෙන මස 04 දිනට පෙර) | ප්‍රධාන ගණකාධිකාරී |

4. ප්‍රධානකාර්යාලයේ එක් එක් අංශවල අධ්‍යක්ෂවරුන් සහ අනෙකුත් අදාල අංශ ප්‍රධානීන්ට ඉහත සඳහන් වාර්තා නියමිත දිනවලදී රාජ්‍ය අයවැය දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීමපහසුවන පරිදි, දිස්ත්‍රික් අධ්‍යක්ෂවරුන් විසින් සෑම අංශයකටමඅදාලවතම දිස්ත්‍රික්කවලව්‍යාපෘති ප්‍රගතිය,ඉහත වගුවේ දක්වා ඇතිදිනවලට, දින තුනකට පෙර ඒ ඒ අංශ වෙත හා අධ්‍යක්ෂ(සැලසුම් හා මෙහෙයුම්) වෙත ඉදිරිපත් කළ යුතුය

5. තවද, දිස්ත්‍රික්ප්‍රගතිය ප්‍රධාන කාර්යාලයේ අධ්‍යක්ෂ (සැලසුම් හා මෙහෙයුම්) වෙත වාර්තා කිරීම තහවුරු කිරීම සඳහා සහ මෙහෙයුම්, පසු විපරම් හා ඇගයීම් ක්‍රියාවලියට යොදවා ගැනීම සඳහා, සෑම දිස්ත්‍රික්කයකින්ම එක්, සුදුසු ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක් බැගින් නම්කොට, එම නිලධාරියාගේ/නිලධාරිනියගේ නම, තනතුර, දුරකථන අංක (ජංගම හා ස්ථිර) හා විද්‍යුත් තැපැල් ලිපින, 2016.05.31 දිනට පෙර අධ්‍යක්ෂ (සැලසුම් හා මෙහෙයුම්) වෙත එවන ලෙස මෙයින් දන්වමි.අධ්‍යක්ෂ සැලසුම් හා මෙහෙයුම්ගේ විද්‍යුත් තැපැල් ලිපිනය dirpm123@gmail.comවේ.

6. තවද, සෑමමසක්අවසානයේදීම, අමාත්‍යාංශ ලේකම් හා අධ්‍යක්ෂ ජනරාල්ගේප්‍රධානත්වයෙන් භෞතික හා මූල්‍ය ප්‍රගතිය විමසීමට භාජනය කිරීමටද නියමිතය. එමෙන්ම, සංවර්ධන කටයුතු සඳහා ඉදිරියේදී භාණ්ඩාගාරයෙන්මුදල් නිදහස් කරනු ලබන්නේ, එලෙස සමාලෝචනයට භාජනයවන ප්‍රගති වාර්තාවල ඇතුලත් කාර්යසාධනය සැලකිල්ලට ගෙන බවද අවධාරණයෙන් දන්වමි.

7. එමෙන්ම, 2016 වසරේදී, ක්‍රියාත්මක කරනු ලබන සෑම ජීවනෝපාය ව්‍යාපෘතියක් තුළින්ම, දිවිනැගුම සහනාධාර ලබන ප්‍රතිලාභී පවුල්වල ජීවන මට්ටම ඉහළට ගෙනැවිත්, එම පවුල් සවිබල ගැන්වීම අපේක්ෂා කරන බැවින්, ඒ පිළිබඳවද දිස්ත්‍රික්කයේ සෙසු අදාල සියලු කාර්යමණ්ඩලය දැනුවත් කොට, ඊට අදාල ඉලක්ක ස්ථාපිත කර ගන්නා ලෙසදමෙයින් දන්වමි.

8. 2016 වසරේ සැලැස්මේ අරමුණු ළඟා කර ගැනීම සඳහා පහත සඳහන් ආකාරයට ඉදිරි සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කළ යුතු බවද වැඩිදුරටත් දන්වමි.

(අ) 2016.11.15 දිනවනවිට සියලු සංවර්ධන වැඩ ඉලක්කගතපරිදිම ක්‍රියාත්මක කොට නිම කළ යුතුය. මේ සඳහා එක් එක් ව්‍යාපෘතියේ ස්වභාවය සලකා මුල සිට අගට අදාල ව්‍යාපෘති නිම කිරීම කොටස් වශයෙන් ඉලක්කගත කොට, ඒ එක් එක් කොටස සඳහා අදාල නිලධාරීන් වෙත ඉලක්ක ලබාදී, ඒ අනුවක්‍රියාත්මක වන්නේදැයිනිරන්තරව පසු විපරම් කළයුතුය.

(ආ) ග්‍රාම නිලධාරී වසම්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ හා දිස්ත්‍රික් මට්ටමේ අදාල සියලූ නිලධාරීන් යොදවා ගනිමින්, ක්‍රියාත්මක කරනු ලබන නව ව්‍යාපෘති සමීපව අධීක්ෂණය, පසු විපරම් කිරීම හා ඇගයීම කළ යුතුය.තවද, දිස්ත්‍රික් මට්ටමේ ප්‍රගති සමාලෝචන වගකීම භාර කළමණාකරුවන් යොදවා, කාලීනවලඟා කර ගන්නා ප්‍රගතිය මේ සමඟ ඇති ඇමුණුම 1 (මූල්‍ය ප්‍රගතිය) හා ඇමුණුම 2 (භෞතික ප්‍රගතිය) පරිදි සෑම මසකම05 දිනට පෙර අධ්‍යක්ෂ (සැලසුම් හා මෙහෙයුම්) වෙත විද්‍යුත් තැපෑලෙන් එවිය යුතුය. (විද්‍යුත් තැපැල් ලිපිනය: dirpm123@gmail.com )

(ඇ) ජීවනෝපාය ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී, සුදුසුම ප්‍රතිලාභීන්ට අදාල ප්‍රතිලාභ ලබා දිය යුතු අතර, සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක් මට්ටමින්ම සුදුසු ප්‍රතිලාභීන් තෝරා නිර්දේශ කිරීමේ වගකීම පහත සඳහන් නිලධාරීන්ගෙන් සමන්විත කමිටුව වෙත පවරනු ලැබේ.

| | | |
|---|---|---|
| මුලස්ථාන කළමණාකරු | - | කමිටු සභාපති |
| ව්‍යාපෘති කළමණාකරු | - | කමිටු සාමාජික |
| කලාප සහකාර | - | කමිටු සාමාජික |

(ඈ) දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂවරුන් විසින් අඩුම තරමින් ඉහත පරිදි නිර්දේශිත ප්‍රතිලාභීන්ගෙන්20%ක් වත් පුද්ගලිකවම පරීක්ෂා කොට, ඊට අදාල නිර්දේශ ඉදිරිපත් කළ යුතුය.

(ඉ) රජය මඟින් ප්‍රතිලාභීන් වෙනුවෙන් වැය කරන සෑම වියදමකටම අදාලව අගයක් හා ප්‍රතිඵලයක් ලබා ගත යුතු අතර, ඉදිරියේදීව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සලකා බලා, අදාල නිලධාරීන්ගේ පුද්ගලික කාර්යසාධන ඇගයීමේදී දළුම තත්ත්වයන්ප්‍රමාණකරණයකට භාජනය කිරිමට විධිවිධාන සලසනු ලැබේ.

9. තවද, දිස්ත්‍රික් දිවිනැගුම, අධ්‍යක්ෂවරුන් විසින් දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් වල ප්‍රගතිය සමාලෝචන,කිරිමසඳහා සෑම මාසයකම10 වන දිනට පෙර ප්‍රධාන කාර්යාලයේදී, ප්‍රගති සමාලෝචනරැස්වීම පවත්වනු ලබන බවද දන්වමි.

මෙම සියලු ක්‍රියාමාර්ග හඳුන්වා දෙනු ලබන්නේ රාජ්‍ය වියදම් දැරීමේදීසකසුරුවමින්, කාර්යක්ෂමව හා සඵලදායීව එම වියදම් දැරිය යුතුවීමේ වගකීම නිසි පරිදි ක්‍රියාත්මක කිරීමේ අපේක්ෂාවෙන් බැවින්, මේ පිළිබඳවඉහළමප්‍රමුඛතාවයලබාදීඉදිරි කටයුතු කරන ලෙස දන්වමි.

චන්ද්‍රා වික්‍රමසිංහ
අධ්‍යක්ෂ ජනරාල්
දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව

පිටපත් :

1. ලේකම් - සමාජසවිබලගැන්වීම්සහ සුභසාධන අමාත්‍යාංශය - කා.දැ.ගැ.ස.
2. සියලුදිස්ත්‍රික් දිවිනැගුමඅතිරේක අධ්‍යක්ෂජනරාල්වරුන්/ දිස්ත්‍රික් ලේකම්වරුන් - කා.දැ.ගැ.ස. සහ අ.ක.ස.
3. අතිරේක ලේකම් ( ග්‍රාමීය සංවර්ධන) - කා.දැ.ගැ.ස. සහ අ.ක.ස.
4. ප්‍රධාන කාර්යාලයේ සියලුම අධ්‍යක්ෂවරුන් හා අනෙකුත් අංශ ප්‍රධානීන් -

   ඉහතින් දක්වා ඇති උපදෙස්වලට අනුකූලවන සේ එක් එක් අංශ මඟින් 2016වසරේ වැඩසටහන් හා ව්‍යාපෘති සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම සිදු කොට, සැලසුම් කර ඇති පරිදි අදාල සියලු වැඩසටහන් හා ව්‍යාපෘති බිම් මට්ටමින් ක්‍රියාත්මක කරනු ලබන බවටත්, ඒ තුළින් අපේක්ෂිත ඉලක්ක ළගා කර ගන්නා බවටත් තහවුරු කර ගන්න. එක් එක් අංශයේ වැඩසටහන් හා ව්‍යාපෘතිවල ප්‍රගතියඅධ්‍යක්ෂ (සැලසුම් හා මෙහෙයුම්) වෙත ලබාදීම සඳහා සුදුසු නිලධාරීයෙකු නම්කොට, එම විස්තර අධ්‍යක්ෂ (සැලසුම් හා මෙහෙයුම්) වෙතඑවන ලෙසද දන්වමි.